// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2057/35 - 2018 පෙබරවාරි මස 09 වැනි සිකුරාදා - 2018.02.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1981 අංක 4 දරන කොන්සියුලර් කර්තව්‍යයන් පිළිබඳ පනත

8 වැනි වගන්තිය යටතේ නිවේදනය

විදේශ කටයුතු අමාත්‍ය, තිලක් මාරපන වන මම, 1981 අංක 04 දරන කොන්සියුලර් කර්තව්‍ය පනතේ 8 වැනි වගන්තිය යටතේ මා වෙත පවරනු ලැබ ඇති බලතල අනුව, විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/දූත කාර්යාල මගින් ඉටුකරනු ලබන මෙම නිවේදනයේ උපලේඛනයේ I තීරුවේ දක්වා ඇති කොන්සියුලර් කර්තව්‍යයන් සම්බන්ධයෙන් 2018 මාර්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙහි උපලේඛනයේ II තීරුවේ දක්වා ඇති ගාස්තු අයකරගත යුතු බව මෙම නිවේදනයෙන් නියමකොට සඳහන් කරමි.

**උපලේඛනය**

| *I තීරුව* | *II තීරුව* | | |
|---|---|---|---|
| *කොන්සියුලර් කර්තව්‍යය* | *ගාස්තුව* | | |
| | *මහා බ්‍රිතාන්‍ය පවුම්* (£) | *ඇ.ඩො.* (US$) | *යුරෝ* (€) |
| විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/දූත කාර්යාල විසින් ඉලෙක්ට්‍රෝනික ලේඛන සහතික කිරීමේ ක්‍රමය (e-DAS) හරහා ලේඛන භාරගෙන අමාත්‍යාංශය මගින් සහතික කරවාගැනීම සඳහා ඉදිරිපත් කරයි. | | | |
| (i) ලේඛනහිමියා ශ්‍රී ලාංකික ජාතිකයෙකු නම් | 18 | 25 | 20 |
| (ii) ලේඛනහිමියා විදේශීය ජාතිකයෙකු නම් | 25 | 35 | 30 |
| *උපත් ලියාපදිංචි කිරීම :* | | | |
| (i) ලියාපදිංචි කිරීම හා උප්පැන්න නිකුත් කිරීම | 18 | 25 | 20 |
| (ii) උප්පැන්න සහතිකයක සහතික කළ පිටපතක් නිකුත් කිරීම | 10 | 13 | 11 |
| *මරණ ලියාපදිංචි කිරීම :* | | | |
| (i) ලියාපදිංචි කිරීම හා මරණ සහතිකයක් නිකුත් කිරීම | 10 | 13 | 11 |
| (ii) මරණ සහතිකයක සහතික කළ පිටපතක් නිකුත් කිරීම | 10 | 13 | 11 |

1A - G 27086 — 57 (2018/02)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| *I තීරුව* | *II තීරුව* | | |
|---|---|---|---|
| *කොන්සියුලර් කර්තව්‍යය* | *ගාස්තුව* | | |
| | *මහා බ්‍රිතාන්‍ය පවුම්* (£) | *ඇ.ඩො.* (US$) | *යුරෝ* (€) |
| ***විවාහ ලියාපදිංචි කිරීම :*** | | | |
| (i) විවාහය ප්‍රසිද්ධ කිරීම (සාමාන්‍ය/උඩරට) | 15 | 20 | 17 |
| (ii) ලියාපදිංචි කිරීම හා විවාහ සහතිකයක් නිකුත් කිරීම (සාමාන්‍ය/උඩරට/මුස්ලිම්) | 25 | 33 | 28 |
| (iii) විශේෂ අවසරය මත විවාහයක් ලියාපදිංචි කිරීම (සාමාන්‍ය/උඩරට) | 33 | 44 | 37 |
| (iv) විවාහ සහතිකයක සහතික කළ පිටපතක් නිකුත් කිරීම (සාමාන්‍ය/උඩරට/මුස්ලිම්) | 10 | 13 | 11 |
| (v) 24 වැනි වගන්තිය යටතේ විවාහය සඳහා අවසරය ඉල්ලා සිටීම (විවාහය පිළිබඳ නිවේදනය) | | ගාස්තු අය නොකෙරේ | |
| ***ලියකියවිලිවල වලංගු බව සනාථ කිරීම, සහතික කිරීම හා සත්‍යාපනය කිරීම (නීත්‍යානුකූලභාවය පරීක්ෂා කිරීම) :*** | | | |
| (i) කේවියට් නියෝගය | 15 | 20 | 17 |
| (ii) සමාදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ලිපිලේඛනවල වලංගුභාවය සහතික කිරීම | 36 | 50 | 40 |
| (iii) දිවුරුම් ප්‍රකාශයක් පිළිබඳ දිවුරුම හෝ සහතික ලෙස ප්‍රකාශ කිරීම | 36 | 50 | 40 |
| (iv) දිවුරුමක් ගැනීම හෝ සනාථකිරීම | 36 | 50 | 40 |
| (v) දිවුරුම් ප්‍රකාශ හෝ පෙරකලාසිවල වලංගුභාවය සනාථ කිරීම | 36 | 50 | 40 |
| (vi) සහතික කළ පිටපතක් නිකුත් කිරීම | 04 | 05 | 04 |
| (vii) ලේඛනයක වලංගුභාවය සනාථ කිරීම (අපනයන ලියකියවිලි හා අධ්‍යාපන සහතික හැර) | | | |
| අ. ලේඛන හිමියා ශ්‍රී ලාංකිකයෙකු නම් | 22 | 30 | 20 |
| ආ. ලේඛන හිමියා විදේශීය ජාතිකයෙකු නම් | 25 | 33 | 28 |
| (viii) අධ්‍යාපන සහතිකවල වලංගුභාවය සනාථ කිරීම | 04 | 05 | 04 |
| (ix) අපනයන ලියකියවිලි කට්ටලයක වලංගුභාවය සනාථ කිරීම | 33 | 44 | 37 |
| ***වෙනත් ලේඛන :*** | | | |
| (i) විශ්‍රාම වැටුප් ලබා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලාංකික විශ්‍රාමිකයින් විසින් ඉදිරිපත් කරනු ලබන ජීවිත සහතික ඇතුළුව සියලුම සහතික | | ගාස්තු අය නොකෙරේ | |
| (ii) මෘත දේහ භූමදානය කිරීම/ආදාහනය කිරීමට අදාළ ලිපි ලේඛන | | ගාස්තු අය නොකෙරේ | |
| (iii) මෘත දේහ ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට අදාළ ලිපි ලේඛන | | ගාස්තු අය නොකෙරේ | |
| (iv) අනෙකුත් සියලුම ලිපි/සහතික නිකුත් කිරීම | 22 | 30 | 25 |
| ***ලේඛන පරිවර්තනය කිරීම :*** | | | |
| (i) ලේඛනයක පළමු වචන 100 පරිවර්තනය සඳහා | 22 | 30 | 25 |
| (ii) ඉන්පසුව සෑම වචන 25 ක ටම වචන 25 ට අඩු සංඛ්‍යාවක් ඉතිරි වී තිබුණද වචන 25 කට අයකරනු ලබන ගාස්තුව අයකරනු ලැබේ. | 04 | 05 | 04 |
| **තැපැල් ගාස්තුව** | | **අය කිරීමට ඇති මුදල** | |

**තිලක් මාරපන,**
විදේශ කටයුතු අමාත්‍ය.

2018 පෙබරවාරි මස 08 වැනි දින,
කොළඹ දී ය.

02 - 851

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.